

# ළමයින්ගේ ලෝකයට - ලෝකෝපකාරය



**විජේරත්න පතිරාජ**
බාහිර කථිකාචාර්ය -
ශ්‍රී පාලි මණ්ඩපය
කොළඹ විශ්ව විද්‍යාලය

ඕස්ට්‍රේලියානු මහා ද්වීපය තුළ පමණක් නොව, ලෝකයේ කුමණ රටකට හෝ සංක්‍රමිකයන් ලෙසට ඇතුලත් වී දිවිගෙවන ඕනෑම තම අනන්‍යතාවය හැඩ ගස්වා ගැනීමේදී ස්වකීය සංස්කෘතික උරුමයන්ගෙන් යුත් අනු සංස්කෘතියක් ගොඩනගාගැනීමේ වගකීම හා යුතුකම අභියෝගයක්ව පවතී මන්ද එය මනාව ඉටු නොවුන හොත් දීර්ඝ කාලීනව ජාතියක් ලෙස පැවත්මක් නොපවතින බැවිනි. ආදි මානවයාගේ පටන්ම මෙම පැවැත්ම සඳහා යොදාගත් ප්‍රධාන මානව බන්ධනය වූයේ එක් එක් ජාතීන් වෙනම වර්ධනය කරගත් භාෂා කුසලතාව හා ආගමික රැකවරණය සුරක්ෂිත කරගැනීම ලෝකයේ සියලුම ශිෂ්ඨාචාරවල ව්‍යාප්ති යසඳහා මෙම සාදක දෙක එකසේ බලපා ඇති බව මානව වංශ පුරාණය ඔස්සේ ප්‍රද්ශණය වේ. එකිනෙකාගේ සන්නිවේදනය සඳහා බසත්, ආරක්ෂාව සඳහා විවිධ ඇදහිලි හා විශ්වාසත් අනුගමණය කිරීම මෙහිදී මූලික චර්යාවන් බවට පත්විය. මානවයාගේ අනිකුත් ඉදිරි ප්‍රවර්ධනයන්හි සංවර්ධනය කාලයාගේ ඇවෑමෙන් විවිධ සිරිත් විරිත්, කලා හා භෞතික නිර්මාණ ඔස්සේ සීග්‍රව වර්ධනය වූයේ මෙම ශීර්ෂ දෙකෙහි අනුකාරකයන් වශයෙනි.

සන්නිවේදන අවශ්‍යතාවන්ගෙන් ඔබ්බට බස මුල් කරගෙන බිහිවූ අපූරු අනුකාරකය වූයේ සාහිත්‍ය කලා නිර්මාණයන්ය. එය සෘජුව මානව උපදේශ හා රසාස්වාදන මෙවලමක් ලෙස වර්ධනයවීම අපූර්වත්වයකි. ආදී යුගයේදී කතන්දර කලාවෙන් ආරම්භවී දියුණු භාරතීය ශිෂ්ඨාචාරය වනවිට සාහිත්‍ය ප්‍රවණතාවයෙහි කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ මානවයාගේ හිත සුව පිණිස උපදේශණ සාහිත්‍යයක් බිහිවීමයි. එහි ආරම්භය වෛදික යුගය හා බැඳී පවතී. ඍග්වේදය, බ්‍රාහ්මණ හා උපනිෂද් වැනි ඉපැරිණි සාහිත්‍ය නිර්මාණ උපදේශණය පදනම් කොට බිහිවී ඇතිබව පෙනී යයි. මහා භාරතය වුවද ප්‍රායෝගික ජීවිතයට අවශ්‍ය මාර්ගෝපදේශනයන්ගෙන් හිස් නොවීය. එහි භගවත් ගීතාවහි එන මිනිසා පරාජය හා ජය ගැන නොතකා, පලවිපාක ගැන නොසිතා තම යුතුකම් ඉටුකළ යුතුය වැනි ප්‍රකාශණ උදාහරණ ලෙස දැක්විය හැක. උපදේශනය අවශ්‍යයෙන්ම සාහිත්‍යයේ අංගයක් විය යුතු බව භාරතීය පිළිගැනීම විය. මෙම සම්මුතිය සංස්කෘත සාහිත්‍ය තුලද ප්‍රබල උපදේශන කාව්‍ය රීතියක් බිහි කිරීමට හේතු වූ බවත්, බුදු සමය ව්‍යාප්තවාදී උපදේශන කලාව පාලි බස ඇසුරින් වර්ධනය වූ බවත් පෙනී යයි.

හෙළදිවට උපදේශන සාහිත්‍යයක බලපෑම ලැබෙන්නේ මෙම භාරතීය බලපෑමට වඩා අතීතයෙහි බුදු සමය පාදක කොටගෙන බිහිවූ සාහිත්‍ය නිර්මාණවලින් යැයි පිළි ගැනේ. පාලි හා සිංහල බසින් එසේ රචිත ග්‍රන්ථ මිනිසාගේ ලෝකෝත්තර විමුක්තිය පමණක් නොව ලෞකික ජීවිතයේ ආධ්‍යාත්මික හා සාදාචාරාත්මක ශික්ෂණය සඳහා අරමුණ කරගෙන බිහිවූ බවට උදාහරණ එමට ඇත. එවැනි විශේෂ නිර්මාණ සේ සැලකෙන ධම්ම පදය හා ජාතක කතා සාහිත්‍යය පමණක් වුවද විමසන කල, මිනිසාගේ එදිනෙදා ජීවිත හැඩගැස්වීමට අරමුණු වූ කෙතරම් ප්‍රබල උපදේශණ ආකෘතියකින් ඒවා පෝෂණය වීදැයි පෙනීයයි. මෙරට ගම්පළ රාජ සමයේදී නැගී ආ හින්දු බලපෑමත්, ඊ ළඟට බිහිවූ කෝට්ටේ යුගයේ බලා වෙනත් බාහිර බලවේගද හේතුකොටගෙන පිරිහෙන්නට වූ සමාජයට නව මානයක් බිහිකරලීමට ගත් වෑයමෙහි ප්‍රතිපලයක් වශයෙන් සිංහල උපදේශන කාව්‍ය විශේෂයක් බිහිවීමද පුදුමයක් නොවේ. එම ග්‍රන්තාවලි අතරින් රනස්ගල්ලේ හිමිපාණන්ගේ ලෝකෝපකාරය, වීදාගම මහා මහනෙත් පාමුල හිමිපාණන්ගේ ලෝවැඩ සඟරාව, අලගියවන්න මුකවැටි තුමාගේ සුභාෂිතය ළමා පරපුර ප්‍රමුඛ සමස්ථ සමාජයේ නැණ ගුණ වර්ධනය අරමුණු කරගත් ප්‍රකට කාව්‍ය ග්‍රන්ථ ලෙස පිළිගැනේ.

සිංහරු දේශය තම ස්ථාවර හදබිම බවට පත්කර ගන්නා සිංහල සංක්‍රමික බාල, තරුණ, වැඩිහිටි ජීවිතවලට බලපාන අභියෝග හමුවේ නැගී සිටීමට අවශ්‍ය ධර්මෝපදේශයන්ගෙන් සමන්විත අපගේ ශ්‍රී ලාංකික සාහිත්‍ය සම්ප්‍රදායේ උරුමයන් පරිශීලනය කිරීමට යොමු කිරීම ඔවුන්ගේ ජීවිතවලට කිසියම් අත්වැලක් වනවාට සැකයක් නැත. විශේෂයෙන්ම මෙරට ජීවත්වන සිංහල සංක්‍රමණිකයන්ගේ භාෂා සංස්කෘතික ප්‍රවර්ධනය සඳහා ඕස්ට්‍රේලියාව පුරා ව්‍යාප්තව ඇති සිංහල පාසල් - පන්සල් ආශ්‍රිත මධ්‍යස්ථානවල බස හදාරන සිසුනට මෙන්ම ගුරු මහත්ම - මහත්මීන්ටද මෙම මගපෙන්වීම සම්පතක් වනු නොඅනුමානය. ඒ අනුව ශාස්ත්‍රීය ප්‍රවේශයක් ලෙස සුප්‍රකට ලෝකෝපකාරයේ රුවන් වැකකි ඇසුරෙන් මෙම සමාජ සත්කාරය ආරම්භ කරනු කැමති වෙමි. මිනිසුන් වශයෙන් උපන් අප මිනිසුන් වශයෙන් ජීවත් වීමේදී, මිනිසුන් වශයෙන් හැසිරිය යුතු වේ. එසේ හැසිරීමේදී මානව වර්ගයාගේ යහපත සඳහාද මිනිසා මුහුණ දෙන ගැටළු නිරාකරණය කිරීම සඳහාද, විවිධ මාර්ග සෙවිය යුතුවේ. එවැනි මාර්ග බොහොමයක් ලෝකෝපකාරයෙහි ඇතුළත් වේ. ඒවා ස්වාර්ථය හා පරාර්ථය පිණිස යොදා ගැනීමෙන් මානව වර්ගයාගේ යහපත පිණිස හේතුවනු නිසැක බව මෙම ග්‍රන්ථයේ උපග්‍රන්ථයේ ප්‍රකාශ වේ. ඒවා අර්ථවිචාරව බුද්ධිමත්ව පරිශීපලනය කිරීමෙන් ඒ බව පසක් කරගත හැකිය. පද්‍ය 236 කින් සමන්විත මෙම ග්‍රන්ථයේ විවිධ වියතුන්ගේ නොමඳ අවධානවට යොමු වූ තෝරාගත් පද්‍ය 25 ක් පිළිබඳව මෙහිදී අවධානයට යොමු කෙරිනි.

දෙගුරුන් විසින් තම දරුවනට -
දෙන නොමද දන නම්
වියතුන් සබාමැද -
ඉන්ට ඉදිරිව ශිල්ප දෙනු මැන

දෙමව්පියන් විසින් තම දරුවන්ට දෙන මහාත්ම වස්තුව නම් උගත් සමූහයා මැද පසු නොබා සිටිය හැකි වන පරිදි ශිල්ප ශාස්ත්‍ර හැදෑරවීමයි.

දෙගුරුන් වඩා -
දරුවනට මැයි දනෝ සෙනෙහස
මෙලොවත් රැක මළත් -
සඟමොක් දෙන බැවින් කරමි පින්

ජනයෝ තම දෙමව්පියන්ටත් වඩා දරුවනට සෙනෙහස දක්වත්. එහෙයින් මේ ලෝකයෙහි ආරක්‍ෂාවීමත්, මරණයෙන් පසු ස්වර්ගය හා මෝක්ෂය ලබා දීමත් සිදුකරන පින්ම ඒ දරුවන් ලවා කරවමු.

ගුණමකු දනන් හා සමඟ විසුවත් නැණැති
සුද නෝ
මනා ගුණ නොහරිත් - කොසොඹ තුර තුළ
බැඳී මීය මෙන්

ඥානවන්ත සජ්ජනයෝ, ගුණමකුවන් සමඟ වාසය කළත්, යහපත් ගුණ අත් නොහරිති. එය කොහොඹ ගසෙහි මීය බැන්දත් එහි මිහිරි රසය නැති නොවන්නා සේ.

රන් බඳුනෙහි කෙසර -
තෙල් අඩු නොවී පවතිනා මෙන්
උතුමන් හද සපිරි -
කුළුණ මෙන් අඩු නොවී පවතී

රත්තරන් භාජනයේ ලු සිංහ තෙල් අඩු නොවී පවතින්නාක් මෙන් උත්තමයන්ගේ හදෙහි පිරුණු කරුණාව හා මෛත්‍රිය අඩුවක් නොවී පවතී.

යමකු තුළ යහපත -
එහි නොවනු සේ ලොව නපුරු නැති
ලුහු දැන කළ නපුර -
සිත නොතබනුයේ යහපතක් වේ

යම් කිසිවකු තුළ වූ යහපත සිහි නොවීම තරම් නපුරක් ලෝකයෙහි නැති තරම්ය. පහත් මිනිසුන් කළ අයහපත සිහිනොකිරීමද එතරම්ම යහපත් වේ.

ඇට සතට වැඩවන -
ගම් මැදෙහි පළතුරක් විලසින
සුදනන් අතට පත් -
ඉසුරු වැඩ වේය සව් ලෙව් හට

ගම් මැද පිහිටි සැමට වැඩ දායක පල දරණ ගසක් මෙන් සජ්ජනයන් සතු කර ගත් වස්තුව සියළු ලෝකයාට යහපතක්ම සලයසි.

නිරා දුකට වැඩියෙන් -
දුකෙක් නැත දිවැසින් බැලූවත්
ඊටත් අතුරු මේ -
දෙගුරුන් නොරැක බඩ වඩන මා

නිරයෙහි දුකට වැඩියෙන් දුකක් ගැන දිවැසින් බැලූවත් නොපෙනේ. දෙමව්පියන් නොරැක තම බඩ වඩාගැනීම එයට වඩා අන්තරාදායක වේ.

සිය පණ සුතනමුත් -
විකුම්සිරි පවතිති නොසිත වූ
නුවණැසින් විමසා බැලුව -
සීනෙන් ලත් ඉසුරු වැනී

තමන්ගේ පණ ද දරුවන්ද අඹුවන්ද සියළු සම්පත් හා මිත්‍රමය ද සැම කල්හිම එක ස්ථානව පවතී යයි නොසිතමු. නුවණ නැමැති ඇසින් විමසා බැලුවහොත් ඒ සියල්ල හීනෙන් ලැබූ සම්පත් වැන්න.

රූ සිරි යොවුන් නැණ ගුණ -
සියල්ලන් නො අඩු මුත්
නොදක්තොත් සිල්ප සත -
සුවඳ නැති කැලෑමල් සම වේ.

රූපශ්‍රීය - යෞවනය, ගුණය හා ඥානය යන සියල්ලෙන් අඩුවක් නැතත්, ශිල්ප ශාස්ත්‍ර නොදන්නෝ සුවඳ නැති කැලෑමල් සම වේ.

ඔවාදෙනු පර හට -
තමා සම්මතෙහි පිහිටා සි ට
දුසිරිත් දනන් දෙන -
ඔවා වැද්දක් කියන බණ වැ නී

යහපත් යයි සම්මත මාර්ගයෙහි පිහිටා සිට අනන්‍යයන් හට අවවාද දෙනු දුෂ්චරිතයෙහි ඇලුණු ජනයා දෙන අවවාද කැලේ වැද්දන් කියන බණ හා සමානය.

තමහට නොසරිවන සත -
සබා මැද ඉඳුව කර බා
සඳ දැක කොඳ පුබුදු වනු දැක සියුම්
හැකිලෙන මෙන්

සඳ රැසින් පිබිදෙන කොඳමල් දැක නෙළුම් මල් හැකිලෙන්නාක් මෙන් තමන්හට නොගැලපෙන ජනයා සිටින සභා මධ්‍යයෙහි කරබාගෙන සිටීම යහපති.

ඇති තෙක්ම කඩතෙල් -
අඳුරු දුරුකර පහන් බැබ ළේ
පින් ඇති තෙක් දනෝ -
සව්සිරිනි පරසිදුව බබලත්

පහන් කඩෙහි තෙල් ඇති තෙක් ම අන්දකාරය දුරුකොට පහන් බැබලෙයි. ඒ අයුරින්ම ජනයාගේ ගුණ ඇති තාක් සියළු ඉසුරින් ප්‍රසිද්ධව බබලත්

පින් පව් කළ සතන් -
එක තැනදීම බලා ගන්නේ
යාන වාහනයෙහි ඉඳිනවුන් -
සමහරෙක් උසුලත්

පින් හා පව් කල ජනයාත් එක තැනකදීම